# කුට්ටම් පොකුණ



ලක්ෂ්මන් කොඩිතුවක්කු

1977 මහ මැතිවරණය පැවැත්වෙන්නට පෙර පැවති කොළඹ ජන රැළියකදී ජේ ආර් ජයවර්ධන ජනතාව අමතා අයාචානය කලේ තමාට තුනෙන් දෙකක බලයක් ලබා දෙන ලෙසය. ජයග්‍රහණය ලැබෙන බව දැන සිටියත් තුනෙන් දෙකක බලයක් ගැන ඔහුට එතරම් විශ්වාසයක් පැවතියේ නැත. නමුත් ජනතාව ඔහුට හයෙන් පහක ජනවරක් ලබා දුන්නා පමණක් නොව ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ ප්‍රධාන විපක්ෂය බවටද පත් කලේය. එම බලයෙන් ජේ ආර් අපුරු සෙල්ලම් මවා පෑවේය. දෙවන වර ඔහු විධායක ජනාධිපති වනවිට යු ඇන් පී තුළ බොහෝ ගැටුම් නිර්මාණය වී තිබුණේය. නමුත් විධායක ජනාධිපති නැමැති සළු පිළි වලින් වසාගෙන ජේ ආර් යු ඇන් පීය තවදුරටත් රැකගත්තේය. ඇතුළත ගැටුම් හා යු ඇන් පිය දෙකඩ වන බව කල්තියාම දැනගත් ඔහු තුන්වන වරටත් බලය ලබා ගැනීමට, ඔහු විසින්ම නිර්මාණය කල ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට මාන බැලුවේය. නමුත් එයට තදින්ම විරුද්ධ වු ප්‍රේමදාස එළිපිටම එයට විරෝධය පෑවේය. ඒ කුමක් නිසාවත් නොව ඊළඟට තමාට ලැබෙන්නට යන නායකත්වය ජේ ආර් නැවතත් ඩැහැගන්නට යන බව ඔහු අවබෝධ කරගත් නිසාය. ප්‍රේමදාස සිතූ පරිදිම ඔහුට යු ඇන් පීයේ නායකත්යට

එකෙනෙකා මරාගන්නා විපක්ෂයක්ද ඔවුන්ගේ වාසනාවට බිහිවී ඇත.

රැකියා ප්‍රශ්න, ජීවන වියදම ඇතුළු දැවෙන ආර්ථික ප්‍රශ්න වලට පිළියම් සොයනු වෙනුවට රජය එම මුදල් වැය කරන්නේ බලය දීර්ඝ කර ගැනීමටය. එහෙයින් මහින්ද චින්තනයෙන් අද දෙදුරුම් කෑමට ලක්ව ඇත.

අනවශ්‍ය ප්‍රවෘත්ති නිර්මාණය කරන ශත පහක ප්‍රයෝජනයක් නැති මෙගා ස්ටාර් තුලට රිංගා ගෙන ජෝකර්වරයෙකු වී ඇති මර්වින් සිල්වා නැවත එම ඇමති ධූරයේම පිහිට වුයේ ජෝකර්ලාගේ සේවය මහින්දට වටිනා නිසාය. සියලුම මාධ්‍යවලින් ඇස් පනාපිටම පෙන්වු සත්‍යය හමුවේ, මහින්ද රටේ ජනතාවට කොකා පෙන්වා ඇත. ලක්ෂ ගනන් මුදල් ගෙවා ව්‍යවස්ථා සංශෝධණයට පක්ෂව විපක්ෂය බාවා ගැනීමට තරම් ශක්තිමත් වී ඇති ඔහු රනිල් වැනි සෙප්පඩ විපක්ෂ නායකවරයෙකු හමුවේ වීරයෙක් බවට පත්ව ඇත.

අගමැතිවරයෙකු වීමය. ජනතා පරමාධිපත්‍ය කදිමට නිරූපණය කළ හැක්කේ ජනතාව පත්කල පාර්ලිමේන්තුවක් හමුවේය. අද ඔවුනගේ එකම තර්කය වන්නේ යුධ ජයග්‍රහණයයි. යුද්ධය ජයග්‍රහණය කලේ විධායක ජනාධිපතිවරයෙකු සිටි නිසා යන්නයි. නමුත් මෙම යුද්ධය ආරම්භ වුයේද විධායක ජනාධිපතිවරයෙකු හමුවේය යන්න ජනතාව අමතක කළයුතු නැත.

එහෙයින් මෙම විධායක ජනාධිපති ධුර කාලයට නැවත වරක් තරඟ කිරීමට සිතා සිටින රනිල්ට තම මාමණ්ඩිය ගෙනා ව්‍යවස්ථාව පාරා වළල්ලක් බවට පත්ව ඇත. ජේ ආර් සිටවු ගසේ ඵල නෙළන්නේ මහින්ද නිසා රනිල්ට සිදුවී ඇත්තේ ඒ දෙස බලාගෙන තලු මැරීම පමණි.

මැකියාවේලි දර්ශණය අනුව යමකට

# සිනාවෙන් හෝ කතාවෙන් බෑ මනින්නට මිනිසා

පත්වු අතර ජනාධිපතිද වුයේය. එසේම ජේ ආර් සිතූ පිරිදිම යු ඇන් පීය දෙකඩ වුයේය. එද සිට පටන්ගත් යුඇන්පීයේ දෙදරා යෑම අද මහා විනාශයක් බවට පත්ව ඇත්තේය. නායකයන් අහිමි වු යු ඇන්පිය තවත් යන එන මං නැතිවුයේ යුද්ධය නිසාය. යුඇන්පීය එද සිටම කලේ යුද්ධය අනාගෙන කෑමය. මහින්ද බලයට පත්වුයේ ඒ අනුවය. චන්ද්‍රිකා බලයට පත්වුයේද ඒ අනාගෙන කෑම නිසාය. දැන් යු ඇන් පීය වැටී ඇති අගාධයෙන් පක්ෂය ගොඩ ගත හැක්කේ කාටද? අතරමං වී වල්මත් වී ආකාශය දිහා බලාගෙන සිටින පාක්ෂිකයන්ගේ මුවට නැඟෙන ප්‍රශ්නය එයයි.

මෙම ඇඩිලි දෙඩිලි කලබල මැද්දේ මහින්ද රාජපක්ෂ ජයග්‍රහණය කල ව්‍යවස්ථා සංශෝධනය තුලින් ඔහුට නැවතත් ජනාධිපති විය හැක. මෙම සංශෝධනය තුලින් ජනාධිපති බලතල වලට වචන වලින් නව අර්ථකථන දී

***<u>සිනහව, කතා විලාශය, සතුරන් සමඟ සුහදශීලී වීම, දුප්පත් ජනතාව අතරට ගොස් සේවකයකු සේ හැසිරීම, කුඩා දරුවන් වඩාගෙන සුරතල් කිරීම, කනස්සලු විය යුතු තැන්වල දුක පෙන්වීම ආදී චරිත ලක්ෂණ නායකයෙකුට අවශ්‍යය.</u>***

ඇත. එහෙත් විධායක නැමැති මහ බලගතු පිළිමයේ එක අංශුමාත්‍රයක් සෙළවී නැත. කවුරුන් කුමන ලෙස මෙය විග්‍රහ කළත් මෙහි ඇති භායානකම කාරණය වන්නේ බලය ඇති මිනිසා බලය අනිසි ලෙස යෙදවීමයි. රාජ්‍ය දේපළ, මිනිස් බලය සියල්ල බලය ඇති මිනිසා ළඟය. ප්‍රේමදාස ජීවත්ව සිටියානම් අප රටේ අදටත් ජනාධිපති ඔහුය. රජය කෙතරම් පිරිහුණත්, ජනතාවගේ ආකර්ෂණයෙන් අදම වුවත් යුඇන් පීය තුන්වරක් බලයට පත්වුයේ (1982 සිට) මෙම විධායක බලතල නිසාය. දෙවන වර බලයට පත් වු ජේ ආර් ඔහුගේ ඡන්ද ප්‍රතිඵල ඉහළට දමාගත්තේ රාජ්‍ය බලය අනිසි ලෙස යෙදවීමකි. භිෂණ සමයේ බලයට පත්වු ප්‍රේමදාස ද එම නාටකය කදිමට නිරූපණය කලේය.

ජනතා පරමාධිපත්‍යයට හිස නමන බව කියන මහින්ද බලයට පත්වුයේ මෙම විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන බව පවසමිනි. නමුත් ඔහු සක්විති දේශපාලඥයේ බව අපට අවබෝධ වන්නේ මෙම ව්‍යවස්ථාව සංශෝධනය හරහාය. අද විධායක ජනාධිපති නැමැති බටර් කේක් ගෙඩියට අයිසින් තවරා ලස්සන කරයි. ඔහු මේ සැරසෙන්නේ කුමකටද ? ඉදිරි පෙළ සිට මේ වෙනුවෙන් ඔහුට අත ඉස්සු දි මු , මෛත්‍රීපාල වැන්නවුන් එයට පක්ෂ වුයේ හෘද සාක්ෂියට එකඟවද? නැත. වසර හයක් බලයේ සිට නැවත ඔහු අනිසි ලෙසින් හෝ තවත් වසර හයක් බලයට පත්වුවහොත් ඉදිරි පෙළේ සිටින වයෝවෘද්ධ ජ්‍යෙෂ්ඨ නායකයන්ට කිසිදක නායකත්වයට පත්විය නොහැක. වයසත් කාලයත් සමගින් දිරාපත් වන ඔවුන් වෙනුවෙන් මහින්ද ඉදිරියට ගන්නට වෑයම් කරන්නේ තවත් රාජපක්ෂ කෙනෙකි. ඒ නිසා ජේවීපිය කියන දෙය අපට පහසුවෙන් බැහැර කළ නොහැක. නාමල්ලාට බැසිල්ලාට තව වසර 10, 15ක් ඉවසා සිටිය හැක. එහෙත් දි.මු. ලාට, මෛත්‍රීපාල සිරිසේන ලාට එහෙම කාලයක් නැත. අහම්බෙන් හෝ ලොතරැයි පතක් ඇදගන්නට තරම්වත් වාසනාවක් නැත්තේ යුද්ධය අවහවර විමේ හේතුවෙනි. මරාගෙන මැරෙන බෝම්බ කරුවන් නිර්මාණය කළ නායකයන් වීමටද ඔවුන්ට අද අවස්ථාවක් නැත. ඒ නිසා මෙම ව්‍යවස්ථා සංශෝධනයෙන් වැඩි වාසි අයත් වන්නේ රාජපක්ෂ පරපුරටය. එයට තව තවත් තල්ලු දීමට දෙකඩ වී

එද ජේ ආර් ජයවර්ධනයට මේ රටේ අරාජිකත්වය කරා තල්ලු කරගෙන යෑමට හැකි වුයේ ශක්තිමත් විපක්ෂයක් නොමැති හේතුවෙනි. අද ඒ තත්වය එලෙසමය. පපඩම් විපක්ෂයක් තුලින් ආණ්ඩුවේ සිදුවන අනිසි ක්‍රියාකාරකම් වලට විරෝධය පෑමට කිසිවෙකු නැත. අද සිටින්නේ මුදලට, ඇමතිකමට හිස නමන ජනතා පුත්‍රයන් හා දියනියන්ය.

මහින්ද අවංක නායකයෙකු නම් ඔහුට කරන්නට තිබුණේ ව්‍යවස්ථාවට -පැච්” දැමීම නොවේ. බොහෝ ගැටුම් නිර්මාණය කර ඇති මෙම ව්‍යවස්ථාවේ බලතල අඩු කර පාර්ලිමේන්තුවට වැඩි බලයක් දී විධායක



රටේ මහ ජනතාව පොළඹවා ගැනීම පහසු නමුත් දිගින් දිගටම එය රඳවා තබා ගැනීම අපහසු බව දන්නා මහින්දට යුධ ජයග්‍රහණය අමතක කරමින් රටේ ප්‍රශ්න ගැන සිතා ජනතාවට අළුතින් යමක් දීමට සිදු වේ. විපක්ෂය එය අවබෝධ කරගෙන නැත. ශක්තිමත් විපක්ෂයක් ගොඩ නගාගන්න කාලය වෙනුවට ඔවුන් බලය තවදුරටත් පවත්වා ගැනිමට උල්පන්දම් දෙයි.

එසේම රනිල් නැමැති විපක්ෂ නායකවරයාට ඒ මැකියාවේලි දර්ශනය අනුව කුමාර ප්‍රතිරූපය ගොඩ නගාගත නොහැක. එම කුමාර ප්‍රතිරූපය ගොඩ නගා ගැනිමට අනුගමනය කළ යුතු කාර්‍යභාරයන් විශාල ප්‍රමාණයක් තිබේ. එයින් එක් කාරණයක් වන්නේ පාරිත්‍යාගීලියකු සේ පෙනී සිටිමයි. සිනහව, කතා විලාශය, සතුරන් සමඟ සුහදශීලී වීම, දුප්පත් ජනතාව අතරට ගොස් සේවකයකු සේ හැසිරිම, කුඩා දරුවන් වඩාගෙන සුරතල් කිරිම, කනස්සලු විය යුතු තැන්වල දුක පෙන්වීම ආදී චරිත ලක්ෂණ නායකයෙකුට අවශ්‍යය. රැවටිල්ලෙන් තොර විශ්වාසනීයත්වය ගෞරවයෙන් පිදුම් ලැබීමට තරම් උසස් සත්‍යයක් වුවත්, රැවටිල්ල පිළිබඳ තීක්ෂණ දැනුමකින් යුතුව එම රැවටිල්ල සත්‍යක් බව ඒත්තු ගැන්වීමට තරම නායකයකු කපටිවිය යුතුය. බලය ලබා ගැනිමට මෙන්ම එම ලබාගත් බලය රැකගැනීමට තරම් මෙම රැවටිල්ල ඔහුට ප්‍රයෝජනයට ගත හැක-

42 පිටට

